# පරිපූරක දැන්වීම

# හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී (PQ 82) - 51 වන වාර්ෂික මහා සභා රැස්වීම

2019 වර්ෂය සඳහා වූ අපගේ වාර්ෂික වාර්තාව, 2020 පෙබරවාරි මස 20 දින දරන 51 වන වාර්ෂික මහා සභා රැස්වීම (AGM) කැඳවීමේ දැන්වීම, එක කොටසක් සඳහා රුපියල් 3/50 බැගින් වූ මුදල් ලාභාංශයක් සහ එක කොටසක් සඳහා රුපියල් 3/50 බැගින් වූ කොටස්කර ලාභාංශයකින් (Scrip Dividend) සමන්විත වූ එක කොටසක් සඳහා රුපියල් 7/- ක් බැගින් ගෙවන බවට හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ("බැංකුව") විසින් යෝජිත අවසාන ලාභාංශය පිළිබඳ විස්තර ඇතුළත් 2020 මාර්තු මස 05 වන දින දරන කොටස් හිමියන් වෙත එවන ලද චක්‍රලේඛය, රටේ දැනට පවතින තත්වය සැළකිල්ලට ගනිමින් බලධාරීන් විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය සහ ආරක්ෂක මාර්ගෝපදේශ හේතු කොටගෙන ඉහත කී වාර්ෂික මහා සභා රැස්වීම (AGM) කල්තබමින් 2020 මාර්තු මස 20 වන දින කොළඹ කොටස් වෙළඳපල වෙත නිකුත් කරන ලද නිවේදනය යන ලිපි ලේඛන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමු.

ඉහත කී ලිපි ලේඛන (https://www.hnb.net) යන අප බැංකුවේ වෙබ් අඩවියේ සහ (https:// www.cse.lk/home/market) යන කොළඹ කොටස් වෙළඳපලේ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.
ඉහත කී වාර්ෂික මහා සභා රැස්වීම 2020 මැයි මස 29 වන දින පහත දැක්වෙන ආකාරයට පවත්වනු ලබන බවට 2020 අප්‍රේල් මස 23 වන දින පවත්වන ලද රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත.

## A. නැවත දින නියම කරන ලද 51 වන වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දිනය :

(1) 2020 පෙබරවාරි මස 20 වන දින දරන රැස්වීම පිළිබඳ දැන්වීමේ සඳහන් කර තිබූ කටයුතු පවත්වාගෙන යාම සඳහා බැංකුවේ පනස් එක්වන (51) වාර්ෂික මහා සභා රැස්වීම 2020 මැයි මස විසි නව වන (29) සිකුරාදා දින පෙරවරු 10.00 ට, කොළඹ 10 ටී.බී ජයා මාවතේ, අංක 479 දරන ස්ථානයේ පිහිටි "HNB ටවර්ස්" හි , 22 වන මහලේ රැස්වීම් ශාලාවේදී (Auditorium) පවත්වනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ

(2) රැස්වීම පවත්වනු ලබන්නේ කොළඹ කොටස් වෙළඳපල විසින් නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශ වලට සහ අදාළ නීති රීතිවලට අනුකූලව ය. එසේම 2020 මැයි මස 29 වන දිනට නියමිත වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන්නේ එම දිනයේදී ඇඳිරි නීතිය බලපවත්වනු නොලබන බවටත් රැසවීම් පැවැත්වීම පිළිබඳව බලධාරීන් විසින් කිසිඳු සීමාකිරීමක් පනවනු නොලබන බවටත් වූ උපකල්පනයන් මතය.

(3) මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව සහ බලධාරීන් විසින් නිකුත් කරනු ලැබ ඇති සෞඛ්‍ය හා ආරක්ෂක මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කිරීම පහසු කිරීමේ කාර්ය සඳහා බැංකුවේ 51වන වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි වන තැනැත්තන් පහත දැක්වෙන ආකාරයට පෞද්ගලිකව පැමිණ සිටීම මගින් සහ ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම මගින් සහභාගිවීම මගින් එකී රැස්වීම පවත්වනු ලැබේ. ඒ පිළිබඳ විස්තර මෙසේ ය :

(i) සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතැම් සාමාජිකයන්, කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි, සමාගම් ලේකම්, බැංකුවේ විගණකවරයා සහ නීති උපදේශකයන් ඉහත (1) වන ඡේදයේ නිශ්චිතව දැක්වෙන ස්ථානයේදී රැස්වනු ඇත

(ii) (පළමුවෙන් ඉදිරිපත් වන කොටස් හිමියන් පළමුවෙන් පිළිගනු ලබන පදනම මත වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගිවීම සඳහා බැංකුව වෙත ලියාපදිංචි වන) උපරිම වශයෙන් කොටස් හිමියන් 50 දෙනෙක් හෝ බැංකුවේ නිකුත් කල කොටස්වලින් සියයට විස්සක් (20%) එක්ව දරා සිටින කොටස් හිමියන් සංඛ්‍යාව යන සංඛ්‍යා දෙකෙන් වැඩි සංඛ්‍යාවකට ඉහත (ස) වන ඡේදයේ සඳහන් ස්ථානයට පැමිණ පෞද්ගලිකව රැස්වීමට සහභාගිවීමට හෝ ප්‍රතියුක්තයෙකු/පෙරකලාසිකරුවෙකු (Proxy Holder) මගින් රැස්වීමට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

(iii) ඉහත (ii) වන ඡේදයේ සඳහන් පරිදි ලියාපදිංචි වන ඉහත (i) වන ඡේදයේ සඳහන් ස්ථානයට පෞද්ගලිකව පැමිණ රැස්වීමට සහභාගිවීමට අවස්ථාවක් නොලැබෙන සහ දුරස්ථ වශයෙන් ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම මගින් එම රැස්වීමට සහභාගවීමට කැමැති සියළු කොටස් හිමියන්ට මයික්‍රෝ සොෆ්ට් ටීම්ස් (Meeting via Microsoft Teams Remote Meeting Platform) හරහා වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගිවිය හැකිය. රැස්වීමේ ලොගින් (Login) තොරතුරු බෙදා හදා ගැනීමට බැංකුවට හැකි වන පරිදි ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම හරහා රැස්වීමට සහභාගිවීමට කැමැති ඉහත සඳහන් කොටස් හිමියන් විසින් රැස්වීම පැවැත්වීමට නියම කර ඇති වේලාවට අවම වශයෙන් පැය 24 කට පෙර තම ඊ-මේල් ලිපිනය - info@hnb.lk ඊ-මේල් ලිපිනයට දැන්විය යුතුය

(4) ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම හරහා දුරස්ථව රැස්වීමට සහභාගි වන සියළු තැනැත්තන් ඡන්දය දෙන අවස්ථාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. සභාපතිතුමා විසින් විධාන කරනු ලබන පරිදි මත ප්‍රකාශ කිරීම සඳහා කොටස් හිමියන්ට ලබාදී ඇති කාල සීමාවතුළදී මහා සභා රැස්වීමේදී කථා කරන විට රැස්වීමට සහභාගි වන පුද්ගලයන් තම අනන්‍යතාවය හෙළිදරව් කල යුතුව ඇත. එම අවස්ථාවේදී කොටස් හිමියෙකු වශයෙන් හෝ ප්‍රතියුක්තයෙකු /පෙරකලාසිකරුවෙකු වශයෙන් තම අනන්‍යතාවය හෙළිදරව් කිරීමේ කාර්ය සඳහා සෑම පුද්ගලයෙකු විසින්ම ඔහුගේ /ඇගේ නම සහ ලිපිනය ඉදිරිපත් කල යුතුය.

(5) රටේ දැනට පවතින තත්වය අනුව මෙම දැන්වීම තැපෑලෙන් එවීමට බැංකුවට නොහැකි වනු ඇත. එම තත්වය අනුව මෙම පරිපූරක දැන්වීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළවන දිනපතා පුවත්පත්වල එක් වතාවක්ද අවස්ථාවක් ලදහොත් ගැසට් පත්‍රයේ එක් වතාවක්ද පළ කරනු ඇත. මෙම දැන්වීම කොළඹ කොටස් වෙළඳපලේ වෙබ් අඩවියේද (https://www.cse.lk/home/market), (https://www.hnb.net) යන අප බැංකුවේ වෙබ් අඩවියේද සහ බැංකුවේ ෆේස් බුක් පිටුවේද පළකරනු ලබන අතර ඒ සමග ඡන්ද බලය හිමි සහ ඡන්ද බලය අහිමි කොටස් හිමියන් සඳහා වෙන් වශයෙන් වූ පෙරකලාසි ආකෘති පත්‍රද පළ කරනු ලැබේ.

(6) තම ප්‍රතියුක්තයන් / පෙරකලාසිකරුවන් සඳහා වූ ආකෘති පත්‍ර නැවත ඉදිරිපත් කිරීමට කැමැති කොටස් හිමියන්ට බැංකුවේ (https://www.hnb.net) වෙබ් අඩවියෙන් බාගත හැකිය. එම එම ආකෘති පත්‍රවලට අදාළ උපදෙස් අනුව යථා පරිදි පුරවා රැස්වීම සඳහා නියම කර ඇති වේලාවට අවම වශයෙන් පැය 24 කට පෙර බැංකුවට ලැබෙන පරිදි එම ආකෘති පත්‍ර info@hnb.lk යන ඊ-මේල් ලිපිනයට එවිය යුතුය. 2020 මාර්තු මස 30 දිනට පෙර කොටස් හිමියන් විසින් දැනටමත් ඉදිරිපත් කර ඇති යථා පරිදි සම්පූර්ණ කල පෙරකලාසි ආකෘති පත්‍ර ඉහත රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට අවම වශයෙන් පැය 24 කට පෙර info@hnb.lk යන ඊ-මේල් ලිපිනය වෙත දැන්වීමක් එවා එම කොටස් හිමියන් විසින්ම ප්‍රත්‍යදිෂ්ඨ කරනු ලබන්නේ නම් මිස නැතහොත් මේ ඡේදයේ සඳහන් පරිදි ප්‍රතියුක්තයෙකු / පෙරකලාසිකරුවෙකු සඳහා තවත් ආකෘති පත්‍රයක් කොටස් හිමියෙකු විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස 2020 මාර්තු මස 30 වන දිනට පෙර කොටස් හිමියන් විසින් දැනටමත් ඉදිරිපත් කර ඇති ප්‍රතියුක්තයන් / පෙරකලාසිකරුවන් සඳහා වූ ආකෘති පත්‍ර වලංගු ලෙස පිළිගනු ලැබේ.

(7) න්‍යාය පත්‍රයේ සඳහන් අයිතමයන් සම්බන්ධයෙන් තම ප්‍රමුඛතා ලකුණු කිරීමෙන් පසු තම ප්‍රතියුක්තයා/පෙරකලාසිකරුවා වශයෙන් යම් කොටස් හිමියෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන් දිරිමත් කරයි. එසේ කරනු ලබන්නේ අදාළ රැස්වීමට යම් කොටස් හිමියෙකු පෞද්ගලිකව සහභාගි වුවහොත් රටේ දැනට පවතින තත්වය අනුව පැන නැගිමට ඉඩ ඇති සෞඛ්‍ය ප්‍රශ්න මඟ හැරීම සඳහා ය.

(8) රැස්වීමට පෞද්ගලිකව පැමිණ හෝ ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම මගින් රැස්වීමට සහභාගිවීමට නොහැකි වන කොටස් හිමියන්ට යම් ප්‍රශ්න ඇත්නම් එම ප්‍රශ්න රැස්වීමට පෙර කවර හෝ අවස්ථාවකදී info@hnb.lk යන ඊ-මේල් ලිපිනයට යොමු කල හැකි අතර ඊට ලැබෙන බැංකුවේ ප්‍රතිචාර, රැස්වීම් වාර්තාවේ පළ කරනු ලබන අතර වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වූ වහාම බැංකුවේ (https://www.hnb.net) යන වෙබ් අඩවියේද කොළඹ කොටස් වෙළඳපලේ (https:// www.cse.lk/home/market) යන වෙබ් අඩවියේද පළ කරනු ලැබේ.

## B. 2007 අංක 7 දරන සමාගම් පනතේ සහ බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවලියේ අදාල විධිවිධාන :

(1) ("සමාගම් පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව සමාගමක වාර්ෂික මහා සභා රැස්වීමක් ශේෂ පත්‍ර දිනයේ සිට මාස 6 ක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය. යම් වර්ෂයක් සඳහා වූ වාර්ෂික මහා සභා රැස්වීම කලින් පැවැති වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා මාස 15 කට නොවැඩි කාලයක් තුළ පැවැත්විය යුත බවට සමාගම් පනතේ තවදුරටත් සඳහන් වේ. බැංකුවේ ශේෂ පත්‍ර දිනය දෙසැම්බර් මස 31 වන දිනය වේ. බැංකුවේ අවසාන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන ලද්දේ 2019 මාර්තු මස 29 වන දින ය.

(2) ඒ අනුව සමාගම් පනත ප්‍රකාරව 2020 වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික මහා සභා රැස්වීම 2020 ජුනි මස 29 වන දින හෝ ඊට පෙර පවත්වනු ලැබිය යුතු අතර එම නිසා නීතිමය තත්වය අනුව 51 වන වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට බැංකුවට 2020 ජුනි මස 29 දින දක්වා කල් ඇත.

(3) බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවලියේ 20 (ii) ව්‍යවස්ථාව ප්‍රකාරව කොටස් හිමියන්ගේ රැස්වීමක් සඳහා වූ ගණපූර්ණය, බැංකුවේ නිකුත් කල කොටස්වලින් සියයට විස්සකට (20%) නොඅඩු ප්‍රමාණයක් දරා සිටින කවර හෝ කොටස් හිමියන් දස දෙනෙකු (10) පෞද්ගලිකව රැස්වීමට පැමිණ සිටීම මගින් හෝ ප්‍රතියුක්තයෙකු / පෙරකලාසිකරුවෙකු මගින් හෝ අන්‍යාකාරයකින් පෙනී සිටීම මගින් සම්පූර්ණ වන්නේ ය.

## C. ලාභාංශ ගෙවීම :

(1) යෝජිත අවසාන ලාභාංශ ගෙවීමේ කාර්ය සඳහා "Dividend Entitlement Date" ('ලාභාංශ හිමිකම් දිනය ') වනුයේ 2020 මැයි මස 29 වන දිනය වන අතර "Ex-Dividend Date" විය යුත්තේ 2020 ජුනි මස 01 වන දින ය. එම දිනයන්හි යම් වෙනස්වීමක් සිදුවුවහොත් එය යථා කාලයේදි දැනුම් දෙනු ලැබේ.

(2) යෝජිත මුදල් ලාභාංශ සහ කොටස්කර ලාභාංශ (Scrip Dividend) ගෙවීම කොටස් හිමියන් විසින් අනුමත කරනු ලබන්නේ නම් එම යෝජිත මුදල් ලාභාංශ සහ කොටස්කර ලාභාංශ (Scrip Dividend) ගෙවීම සම්බන්ධයෙන් 2020/02/20 වන දින දරන කොටස් හිමියන් වෙත නිකුත් කරන ලද චක්‍ර ලේඛයේ සඳහන් සියළු විධිවිධාන අදාළ වේ.

(3) යම් ආකාරයකින් තැපැල් සේවා අඩපනවීම සිදුවුවහොත් ඒ හේතු කොටගෙන ලාභාංශ චෙක්පත් තැපෑල මගින් එවීමට නොහැකි වුවහොත්, තම ගිණුම් අංක /ලාභාංශ ගෙවීමේ උපදෙස් ලැබී නොමැති කොටස් හිමියන්ට ලඟම ඇති හැටන් නැෂනල් බැංකු ශාඛාව වෙත පැමිණ චෙක්පතක් මගින් තම මුදල් ලාභාංශ ලබාගත හැකි ය. බැංකු නිලධාරීන් විසින් එම චෙක්පත් කොටස් හිමියන්ට නිකුත් කල හැකි වන පරිදි, එම කොටස් හිමියන් විසින් තම අනන්‍යතාව සහ ලිපිනය පිළිබඳ විස්තර බැංකුවට ඉදිරිපත් කල යුතු ය. කෙසේ වුවද තැපැල් සේවා සාමාන්‍ය තත්වයට පැමිණුනහොත් සියළුම ලාභාංශ චෙක්පත් තැපැලෙන් එවනු ලැබේ.

## D. 2020 මාර්තු මස 30 වන දින පැවැත්වීමට නියමිතව තිබූ වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම :

ඔබට දැනටමත් ලැබී ඇති ඉහත සඳහන් 2020 පෙබරවාරි මස 20 වන දින දරන වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම මෙම පරිපූරක දැන්වීම සමග එක්ව කියවා බලන්න

එකී 2020 පෙබරවාරි මස 20 වන දින දරන වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම මෙම පරිපූරක දැන්වීම මගින් සංශෝධනය කරනු ලැබ ඇත්තේ කලින් දැන්වීමේ සඳහන් දිනය, වේලාව, රැස්වීමට සහභාගිවීමේ ක්‍රමවේදය සහ රැස්වීමේ කටයුතු පවත්වාගෙන යාම යන කරුණු සම්බන්ධයෙන් පමණකි

**හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**

**K. A. L. තුෂාරි රණවීර මහත්මිය.**
**නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (නීති)/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.**

2020 අප්‍රේල් මස 23 වන දිනදී ය.

සටහන : මෙම පරිපූරක දැන්වීමට අදාළව ඔබට යම් ප්‍රශ්න ඇත්නම් කරුණා කර සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ (පෙරවරු 8.30 සිට පස්වරු 5.00 දක්වා) දුරකථන අංක 0094-112661856 හරහා ශිරෝමි හල්ලොලුව මෙනවිය (නීති අංශයේ ප්‍රධානි) හෝ දුරකථන අංක 0094-112661938 හරහා චින්තා ප්‍රනාන්දු මිය හෝ දුරකථන අංක 0094-112661941 හරහා ස්වර්ණි ලියනපතිරණ මිය අමතන්න.

ඔබේ ප්‍රගතියේ සහකරු

ෆිච් රේටිං AA-(lka)

හැටන් නැෂනල් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන වාණිජ බැංකුවකි.

Hatton National Bank PLC - PQ 82